# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2183/48 - 2020 ජූලි මස 10 වැනි සිකුරාදා - 2020.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 (ඇ) සහ 154 (ඊ) ව්‍යවස්ථාවන් යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ඌව පළාත් ආණ්ඩුකාරවර අධිනීතිඥ රාජා කොල්ලුරේ වන මා විසින් පහත සඳහන් පත්කිරීම කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ඌව පළාතේ පළාත් සභාවේ 2001 අංක 01 දරන ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරි ප්‍රඥප්තියේ 6 (ඇ) (1) වගන්තිය අනුව, ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්, දයානන්ද රත්නායක මහතා 2020.05.27 වැනි දින සිට ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලබලැති සාමාජික ලෙස පත්කිරීමට,

02. ඌව පළාතේ පළාත් සභාවේ 2000 අංක 05 දරන ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තියේ 13.5 වගන්තිය අනුව, ඌව පළාත් මුදල් හා ක්‍රමසම්පාදන නීතිය හා සාමය, අධ්‍යාපන (ද්‍රවිඩ පාසල් හැර), පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්, ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල මහත්මිය, 2020.03.11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයේ නිත්‍ය සභාපතිවරයෙකු පත් කරන තෙක්, සභාපති ලෙස තාවකාලික පදනමින් රාජකාරි ආවරණය කිරීම සඳහා පත්කිරීමට,

03. ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක 05 දරන ඌව පළාතේ ගෙවල් කුලී ප්‍රඥප්තියේ 5 (1) වගන්තිය සමග කියවිය යුතු 1972 අංක 07 දරන ගෙවල් කුලී පනතේ 44 වැනි වගන්තිය අනුව, රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි පංතියේ නිලධාරිණී, ඊ. පී. ඒ. ශ්‍රියාකාන්ති මහත්මිය, වහාම ක්‍රියාත්මක වන පරිදි (2020.02.24 වැනි දින සිට) ඌව පළාත් ගෙවල් කුලී මණ්ඩලයේ බලයලත් නිලධාරි ලෙස පත්කිරීමට.

අධිනීතිඥ රාජා කොල්ලුරේ,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2020 ජූලි මස 06 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,
රජවීදිය, බදුල්ලේ දී ය.

07 - 706